**ශීර්ෂය 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 නොවැම්බර් 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාචෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කලමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව හෙළිදරව් කිරීම් ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම යටතේ දක්වා තිබූ රු. 1,215,000 ක් භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ වර්ෂයේ මිලදී ගැනීම් යටතේ රු.37,615,000 ක් ලෙස දක්වා තිබිමෙන් රු. 36,400,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2019 දෙසැම්බර් 3 දිනැති අංක 271/ 2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එහි ඇතුළත් කළයුතු සංඛ්‍යානමය අගයන් භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශනයේ අගයන් හා සැසඳි තිබිය යුතු වීම. | 2016 සිට ඉදිකිරීම් ආරම්භ කළ මෙම ගොඩනැගිල්ලට වාර්ෂිකව ගෙවූ ඉදිකිරීම්වල වටිනාකම නිම නොකළ වැඩ ලෙස පෙන්වා 2019 වසරේ ඉදිකිරීම් නිම කර භාර දීමෙන් පසුව එය නිම කළ වැඩ ලෙස CIGAS පද්ධතියට ඇතුළත් කළ නිසා එය වසරේ අත්පත් කර ගැනීමක් ලෙස පෙන්නුම් කෙරේ. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| **වාහන ලොග් පොත** | | |
| මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු වාහන 41 න් වාහන 21 කට අදාළ ලොග් සටහන් පොත් යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලොග් සටහන් පොත් යාවත්කාලීන කළ යුතු වීම. | වාහන 21 ට අදාළ ලොග් සටහන් පොත් හැකි ඉක්මනින් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 1.6.3 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

-----------------------------------------------

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන් පරිදි වේ.

| | විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම. | | |
| (අ) | 2008 පෙබරවාරි 06 දිනැති අංක 05 / 2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛයේ 2.3 ඡේදය | පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා දෙපාර්තමේන්තුව විසින් ක්‍රමවේදයක් සකස් කළයුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | කාර්යසාධන වාර්තාවෙහි අනුකූලතා වාර්තාව අනුව ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකට ම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් වාහන 21 ක එලෙස ඉන්ධන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාව කළ යුතු වීම. | දෙපාර්තමේන්තුව සතු සියලුම වාහන සඳහා ඉන්ධන පරීක්ෂාවන් මෙම වසර අවසන්වීමට ප්‍රථම සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2019 ජූලි 30 දිනැති අංක 1/2019 දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ iv ඡේදය | සියලුම ක්ෂේත්‍ර නිලධාරීන් එක් එක් මාසය වෙනුවෙන් තම ඉදිරි වැඩසටහන එම මාසයට පෙර මාසයේ 25 දිනට ප්‍රථම ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවත්, භෞතික පරීක්ෂාව සිදු කළ එක ප්‍රාදේශීය කාර්යාලයක ක්ෂේත්‍ර නිලධාරීන් 12 ක් විසින් එකතුව මාස 36 ක් සඳහා ඉදිරි වැඩසටහන් ඉදිරිපත්කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව එක් එක් මාසය වෙනුවෙන් ඉදිරි වැඩසටහන එම මාසයට පෙර මාසයේ 25 දිනට පෙර ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වීම. | ඉදිරි වැඩසටහන් නියමිත දිනට ඉදිරිපත් කරන ලෙස සියලු ක්ෂේත්‍ර නිලධාරීන්ට අවවාද කරන ලදි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් දෙකක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් රු.90,901 ක් හා රු.10,262 ක් වශයෙන් සියයට 12 ක් හා සියයට 15 ක් ලෙස ඉතිරි වීම් පැවතුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්මේන්තු සකස් කළයුතු වීම. | වැඩ බැලීම් කටයුතුවලට ගමන් වියදම් ගෙවීම නතර කිරීම නිසාත් කොමසාරිස් ජනරාල් නිල නිවසේ ජල හා විදුලි බිල් සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු වැඩිපුර මුදල් දැරීම නිසාත් මුදල් ඉතිරි විය. |
| (ආ) | මූලධන වියදම්වලින් සියයට 15 ක් හා සියයට 10 ක් බැගින් ඉතිරි කිරීම් කළ යුතු බව දක්වා තිබුණි. එසේ වුවද දෙපාර්තමේන්තුවේ සමස්ත මූලධන වියදම් ප්‍රතිපාදනය වූ රු.5,500,000 කින් ඉතිරිය රු.1,104,355 ක් වූ අතර එය සියයට 20 ක් පමණක් විය. | 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වසර ආරම්භයේ මෙවැනි තීරණ ලබාදී නොතිබීම නිසා මෙවැනි තත්ත්වයක් සිදු වී තිබේ. |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික, වැඩ තහනමට ලක් වූ සහ සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවීම් නතර වූ ණය ශේෂ එකතුව රු.499,305 ක් වූ අතර එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 කට වැඩි කාල පරාසයක සිට පැවත එමින් තිබූ නමුත් එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ හිටි ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | විශ්‍රාමික නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.318,415 ක මුදල විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමටත් වැඩ තහනමට ලක්වූ නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.176,390 ක ණය ශේෂයෙන් රු.93,730 ක් විනය ක්‍රියාමාර්ග අවසන් වූ පසු විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමටත් රු.82,660 ක් සේවයේ නැවත පිහිට වූ නිලධාරියාගෙන් ඉදිරියේදී අයකර ගැනීමටත් සේවය හැර ගිය නිලධාරියාගේ ණය ශේෂය කපා හැරීමටත් කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 සැලසුම් කිරීම

--------------

චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සකස්කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | 2004 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2014 ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට මානව සම්පත් සංවර්ධන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වීම. | කාර්යසාධන වාර්තාවෙහි අනුකූලතා වාර්තාව අනුව, 2020 වර්ෂය සඳහා සෑම ක්ෂේත්‍රයකම නිලධාරීන් නියෝජන වන පරිදි පුහුණු සැලැස්මක් සකස් කර ඇත. අභ්‍යන්තර විගණක තනතුර 2019 වර්ෂය තුළ පුරප්පාඩු වී පැවතිම. |
| (ආ) | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වර්ෂ 05 තුළ බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඉලක්ක පිහිටුවීම දිගින් දිගටම පහත හෙළා ඇති බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව විසින් ඉලක්ක පිහිටුවීමේදී පෙර වර්ෂයේ ප්‍රගතිය , ලැබී ඇති ප්‍රතිපාදන, සේවක සංඛ්‍යාව, ආයතනයේ ශක්‍යතාවය හා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කඩයිම් සිතියම් ලබාදීමට සකසා ඇති ඉලක්ක සැලකිල්ලට ගත යුතු වීම. | පසුගිය වර්ෂවලින් අත ඉතිරි කැබලි සංඛ්‍යාව, ඉලක්කගත වර්ෂය සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ලබාදීමට ඉලක්ක ගත කැබලි සංඛ්‍යාව, සේවක සංඛ්‍යාව, ආදිය පදනම් කර ගනිමින් ඉදිරි වර්ෂයේ සිට ඉලක්ක සකස් කිරීමට කටයුතු කරමින් පවතී. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය කාර්යාල 28 ක 14 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා එවා ඇති ඉඩම් කැබලි සංඛ්‍යාවේ ප්‍රගතිය 2018 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 15ක සිට සියයට 81 ක් දක්වා පරාසයකින් අඩුවීමක් නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් බිම්සවිය වැඩසටහන කඩිනම් කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවලක් හඳුන්වා දිය යුතු වීම. | 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂය තුළ කැඩැස්තර සිතියම් ලැබීම අඩුවීමක් ඇති අතර මැනුම් ඉල්ලීම් කළ ප්‍රමාණයට මැනුම් කර කැබලි ලැබී නොමැති බැවින් පසුගිය වර්ෂයෙන් ඉතිරි කැබලි පදනම් කරගෙන තීරණ ලබාදී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා හිමිකම් නිරවුල් කිරීමේදී පසෙක තබා තිබූ ලිපිගොනු 485,351 කින් ලිපිගොනු 46,656 කට එනම් සියයට 10 කට පමණක් විසඳුම් ලබාදී තිබුණි. මෙලෙස පසෙක තබන ලිපිගොනු සම්බන්ධයෙන් කටයුතු කිරීමට විශේෂ වැඩපිළිවලක් සකස් නොකිරීම හේතුවෙන් නිරවුල් කිරීමේ කාර්යයන් ඉටු කිරීම ප්‍රමාද වී තිබුණි. | පසෙක තැබූ ගොනු පිළිබඳව කටයුතු කිරීමට කඩිනම් වැඩපිළිවලක් සකස් කර ඒ අනුව කටයුතු කළයුතු වීම. | පසෙක තබා ඇති ගොනු සඳහා නැවත තිරණ ලබා දීමට ඇති හැකියාව පරීක්ෂා කොට එහි ප්‍රගතිය මාසිකව ප්‍රධාන කාර්යාලයට වාර්තා කළ යුතු වන ලෙසට 2020 ජුනි 30 දිනැති අංක 04/06/16 -01 දරන ලිපිය මඟින් සියලු ප්‍රාදේශීය කාර්යාල දැනුවත් කරන ලදී. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ වූ ප්‍රධාන කාර්යයන් 08 න් මැන වෙන් කිරීම් පරීක්ෂා කිරීම, රේඛා චිත්‍ර ඉල්ලුම් කිරීම, නිරවුල් කිරීමේ ආඥාව ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවීම, නිරවුල් කිරීමේ ආඥාව අමාත්‍යාංශ අනුමැතියට යැවීම හා නිරවුල් කිරීමේ ආඥා ගැසට් පත්‍රයේ පළ කිරීම යන කාර්යයන් 5 ක ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවතුණි. | සැලසුම් කළ පරිදි ඉලක්කයන් ලබා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉඩම් නිරවුල් කිරීමේ මූලික පියවරයන් 22 ක් සම්පූර්ණ විය යුතුය. එයින් එක් පියවරක් කරා යාමට ප්‍රමාද හෝ සම්පූර්ණ නොවූ අවස්ථාවලදී නිරවුල් කිරීම ඉදිරියට යාමට අපහසු වේ. |
| (ඈ) | බිම්සවිය වැඩසටහන 2002 වර්ෂයේ ආරම්භ කර 2021 වර්ෂය අවසන් වන විට නිම කිරීමට මූලිකව සැලසුම් කර තිබුණි .එසේ වුවත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 17 ක් ගත වී තිබුණත් එම වැඩසටහන ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 58 ට අයත් මුළු ග්‍රාම නිලධාරි කොට්ඨාශ 3621 න් මිනුම් කටයුතු අවසන් කර තිබුණේ කොට්ඨාශ 1359 ක එනම් සියයට 38 ක පමණි. | සැලසුම් කළ පරිදි ඉලක්කයන් ලභාකර ගැනීමට විධිමත් වැඩ පිළිවලක් සකස් කළ යුතු වීම. | ග්‍රාම නිලධාරී වසමක් අවසන් වීම සඳහා කලාප සිතියම් සියල්ලම ලැබිය යුතුය. නමුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා අනුයුක්ත මිනින්දෝරු සංඛ්‍යාව මත වර්ෂය සඳහා අපේක්ෂිත වසම් සංඛ්‍යාව මැනුම් කර අවසන් නොවේ. තවද දෙපාර්තමේන්තුව මඟින් පසුගිය වර්ෂවල යොමු කළ මැනුම් ඉල්ලීම් සඳහා මැනුම් කටයුතු සිදුවන්නේ මේ වර්ෂයේ බැවින් මැනුම් කටයුතු අවසන් කිරීම ප්‍රමාද වී ඇත. |

**3.3 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | වර්ෂ 02 ක කාලයක සිට ධාවනය නොකර දෙපාර්තමේන්තු පරිශ්‍රයේ නිශ්කාර්යව ගාල් කර තිබූ ඩබල් කැබ් රථය 2019 මැයි මාසයේදී රු.2,000,000 කට තක්සේරු කර තිබුණද අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු වීම. | චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ප්‍රාදේශීය කාර්යාලයක පරිගණක හා උපාංග 26 ක් භාවිතයෙන් තොරව වර්ෂ 03ක සිට වර්ෂ 07ක් දක්වා කාල පරාසයක සිට නිෂ්කාර්යව පැවති අතර පරිගණක අංශයේ සවිකර තිබුණු පරිගණක හා උපාංග 05 ක් වර්ෂ 3 ක පමණ සිට කාර්යාල කටයුතු සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | මෙම කාර්යාල උපකරණ ආයතනික කටයුතු සඳහා ඵලදායීව යොදා ගැනීමට හෝ අවශ්‍යතාව ඇති වෙනත් ප්‍රාදේශීය කාර්යාල වෙත ලබා දීමට කටයුතු කළ යුතු වීම. | ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද සිය ඔප්පු ලියාපදිංචි කිරීමට අදාළ මාර්ග ගත පරිගණක පද්ධතිය සම්පූර්ණයෙන් ස්ථාපිත කර නොමැති වීම හේතුවෙන් කාර්යාලයට ලබාදුන් පරිගණක භාවිතා කිරීම සිදු කර නොමැත. මෙම පරිගණක හා උපාංග ඉදිරියේදී අවශ්‍යතා ඇති වෙනත් කාර්යාල වලට ලබාදීමට කටයුතු කරමි. |
| (ඇ) | ගිණුම සමඟ ඉදිරිපත් කර ඇති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ රු.36,400,000 ක වටිනාකමට දක්වා තිබූ නිල නිවාසය 2018 වර්ෂයේ ඉදිකර අවසන් කර තිබුණු නමුත් ඉඩමේ අයිතිය පවරාගෙන නොතිබුණි. | ඉඩමේ අයිතිය පවරා ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | බස්නාහිර පළාත් සභා ආණ්ඩුකාරවරයා වෙත කඩුවෙල ප්‍රාදේශීය ලේකම්වරයා හරහා ඉඩමේ අයිතිය ලබා ගැනීමට ලියවිලි ඉදිරිපත් කර ඇත. |

**3.4 පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------------------------- |
| (අ) | 2011 වර්ෂයේ දෙපාර්තමේන්තුව සතු ඩබල් කැබ් රථයක සිදු වූ අනතුරක් සම්බන්ධයෙන් අළුත්වැඩියා වියදම වූ රු.22,250 ක් මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව පොත්වලින් කපාහැරීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශන වල දිගින් දිගටම හෙළිදරව් කර තිබුණි. | වර්ෂ 8 ක් පැරණි මෙම ශේෂය පොත්වලින් කපා හැරීමට කටයුතු කළ යුතු වීම. | මෙම වාහනයට සිදු වූ අයකර ගැනීමට නොහැකි වූ හානිය සම්බන්ධයෙන් 2020 වර්ෂය තුළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතිය ඇතිව කපා හැරීමට කටයුතු කරමි. |
| (ආ) | 2019 වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණයෙන් ප්‍රධාන කාර්යාලයේ අංශ 2 ක හා ප්‍රාදේශීය කාර්යාලය 4 කට අදාළව අනාවරණය වූ පරිගණක හා උපාංග 22 ක් ලිබඩු හා කාර්යාල උපකරණ 24 ක් හා විදුලි උපකරණ 07 ක් වශයෙන් භාණ්ඩ 53ක ඌණතාවයන් පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.. | භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වන ඌනතාවයන් පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | තවදුරටත් පරීක්ෂා කිරීමෙන් පසුව තොරතුරු ඉදිරිපත් කරමි. |

**4. මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------- | ----------- | ------------------------------ |
| (අ) | උතුරු හා නැගෙනහිර පළාත්වල කඩිනමින් ප්‍රාදේශීය කාර්යාල විවෘත කිරීමේ අරමුණින් සංවර්ධන නිලධාරී තනතුරට නිලධාරින් 17 දෙනෙකු 2013 වර්ෂයේදී බඳවා ගෙන උතුරු හා නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට තාවකාලිකව අනියුක්ත කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමට කටයුතු කර නොතිබුණු අතර නිලධාරීන්ගේ පරිපාලන කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කළද නිලධාරීන් විසින් ඉටු කරන රාජකාරී දෙපාර්තමේන්තු රාජකාරී වලට අදාළ නොවන බවද නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් පිළිබඳ සලකා මේ වන විට පිහිටුවා ඇති ප්‍රාදේශිය කාර්යාල වෙත අනුයුක්ත කිරීමට හෝ උතුරු නැගෙනහිර ප්‍රාදේශිය කාර්යාල කඩිනමින් විවෘත කිරීමට කටයුතු කළ යුතු වීම. | පුරප්පාඩු පවතින රජයේ වෙනත් ආයතන වෙත මෙම නිලධාරීන් නිදහස් කිරීමට පියවර ගන්නා ලෙස දැනුම් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලය 2238 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 826 ක් එනම් අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 63 ක් එනම් 1412 ක් පුරප්පාඩු වී පැවතුණි. ප්‍රාදේශීය කාර්යාල 90 ක් පවත්වාගෙන යාම සඳහා කාර්ය මණ්ඩලය අනුමත කරගෙන තිබුණද වර්තමානයේ ප්‍රාදේශීය කාර්යාල 43 ක් පමණක් පවත්වාගෙන යාම තුළ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු නොකිරීම නිසා මෙලෙස විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතීමට හේතු වී තිබුණි. | ප්‍රාදේශීය කාර්යාල 43 ට අනුගත වන පරිදි කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව වැඩි කර පුරප්පාඩු සියල්ල සම්පූර්ණ කිරීමට අපේක්ෂා කර ඇත. |